# 21 ස්වාමිවාක් ආරාධනාව




21. 1 රූපය - ස්වාමිවාක් ආරාධනාව උගන්වන ජේසුස් වහන්සේ

දිනක් ජේසුස් වහන්සේ යාච්ඤා කරමින් සිටි සේක. ඔවුන් වහන් සේ යාච්ඤා කිරීම නිම කළ විට ශ්‍රාවකයෙක් "ස්වාමීනි, ජොහන් තම ගෝලයන්ට ඉගැන්වූ ලෙස, අපටත් යාච්ඤා කරන්නට ඉගැන්නුව මැනවැ'යි කිවේ ය. එම ඉල්ලීමට සවන් දුන් ජේසුස් වහන්සේ ද "ඔබ යාච්ඤා කරන කල මෙසේ කියන්න"යැ'යි පවසමින් ඔවුනට "ස් වාමිවාක් ආරාධනාව" ඉගැන් වූ සේක. අපගේ ස්වාමීන් වන ජේසුස් වහන්සේ විසින් ම ඉගැන්වූ යාච්ඤාව නිසා එම යාච්ඤාව "ස්වාමිවාක් ආරාධනාව" යනුවෙන් හඳුන්වනු ලබයි. මෙම යාච්ඤාව "ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව" හා "පරමණ්ඩල යාච්ඤාව" යනුවෙන් ද හැඳින්වේ. එම යාච්ඤාව මෙසේ ය;

ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි, ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා! ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා! ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මොලොවේ ද ඉටු වේවා! අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව. අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව. පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදී අයහපතින් අප මුදා ගත මැනව.

ස්වාමිවාක් ආරාධනාවට අනුව, යාච්ඤාවක ඇතුළත් විය යුතු ප්‍රධාන ලක්ෂණ කිහිපයකි. ඒවා මෙසේ ය;

| යාච්ඤාවේ ලක්ෂණ | ස්වාමිවාක් ආරාධනාව |
|---|---|
| දේව ප්‍රශංසාව | ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා! |
| දේව නමස්කාරය | ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා! ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවෙහි ද ඉටු වේවා! |
| ඉල්ලීම | අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව! |
| සමාව යැදීම | අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව! |
| දේව ආරක්ෂාවට නතුවීම | පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදී අයහපතින් අප මුදා ගත මැනව! |

ස්වාමිවාක් ආරාධනාවේ දී දෙවියන් වහන්සේ අමතනු ලබන්නේ, "මාගේ පියාණනි" ලෙසින් නොව, "අපගේ පියාණනි' යනුවෙනි. "අපගේ පියාණනි" යන ආමන්ත්‍රණය තුළ සාමූහික බවක් දක්නට ලැබේ. එහෙයින් සාමූහික දේව වන්දනා පිළිවෙත්හි මෙම යාච්ඤාව බෙහෙවින් ම උච්චාරණය කරනු ලබයි. දිව්‍ය පූජා යාගය මීට කදිම නිදසුනකි. එසේ වුව ද පෞද්ගලික යාච්ඤාවේ දී ද අප එය භාවිත කරමු.

අප යාච්ඤා කරන කල දෑත් වැඳගෙන ළය මත තබා ගනිමු. එහෙත් ස්වාමිවාක් ආරාධනය උච්චාරණයේ දී එම ඉරියව් භාවිත නොකරයි. එහි දී දෑත් දෙපසට දිගුකර යදින්නට ශුද්ධ වූ සභා මාතාව අපට ඇරයුම් කරයි. එහෙයින් මෙම ඉරියව් නිවැරදි ව පවත්වා ගනිමින් ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කිරීම අපගේ යුතුකමකි.

ස්වාමිවාක් ආරාධනාවේ ප්‍රශංසාත්මක පැතුම් තුනක් හා ශාරීරික හා ආධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම් හතරක් ඇත.

## 1. ප්‍රශංසාත්මක පැතුම්

### (i) ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා!

සියලු දේ මවා වදාළ දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා කරයි.

**(ii) ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා!**

කිතුනු අපගේ අවසාන බලාපොරොත්තුව දේව රාජ්‍යයට ඇතුළු වීම ය. එම දේව රාජ්‍යය මිහිමත උදා කරවන ලෙස ප්‍රාර්ථනා කරයි.

**(iii) ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවෙහි ද ඉටු වේවා!**

පියාණන් වහන්සේගේ අභිමතය ස්වර්ග රාජ්‍යය තුළ පමණක් නොව මිහිමත ද සඵල වේවා! යි ඉල්ලා ප්‍රාර්ථනා කරයි.

## 2. ශාරීරික හා ආධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම්

**(i) අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව**

ඉශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවේ සිට පොරොන්දු දේශය කරා යන ගමනේ දී මන්නා භෝජනයෙන් පෝෂණය කළා සේ අපගේ දිනපතා ආහාරය ලබා දෙන ලෙස අයදිමු. එපමණක් නොව ආත්මික ආහාර වන දේව වචනයෙන් හා දිව්‍ය සත්ප්‍රසාද භෝජනයෙන් ද අප පෝෂණය කරන ලෙස අයැද සිටිමු.

**(ii) අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන්, අපගේ වැරදි ද කමා කළ මැනව**

අන් අයගෙන් අපට සිදුවන වැරදි හා අතපසුවීම්වලට ඔවුනට සමාව දිය යුතු ය. එහි දී අප ඔවුන්ගේ වරදට සමාව දෙන්නේ කෙසේ ද එලෙස ම අපගේ වරදට ද සමාව දෙන ලෙස පියාණන් වහන්සේගෙන් අයැද සිටිමු.

**(iii) පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩනොදී**

දේව පනත්වලට විරුද්ධ ක්‍රියාවන් සඳහා ඉඩ නොදී අප ආරක්ෂා කරන ලෙස අයැද සිටිමු.

**(iv) අයහපතින් අප මුදා ගත මැනව**

සියලු ම ආත්මික හා ශාරීරික උපද්‍රවයන්ගෙන් අප මුදවා ගන්නා ලෙස අයැ ද සිටිමු.

මෙම ප්‍රශංසාත්මක ප්‍රාර්ථනාවෙන් හා ශාරීරික හා ආධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම් තුළින් දෙවි පියාණන් වහන්සේට අප හදවත් තුළ ඇති ප්‍රශංසාව ගෞරවය පුද කරනු ලබයි. එමෙන් ම සත්‍යය, යුක්තිය රජයන දේව රාජ්‍යය මිහිමත සුපතළ වේවා! යි ප්‍රාර්ථනා කරනු ලබයි. එපමණක් නොව නිවැරදි දේ වටහා ගෙන යහමග යාමට අවශ්‍ය ශාරීරික හා ආධ්‍යාත්මික පෝෂණය සහ මග පෙන්වීම පියාණන් වහන්සේගෙන් අයැද සිටියි.

**ජේසුස් වහන්සේ විසින් ම ඉගැන්වූ ස්වාමිවාක් ආරාධනාව**

- නිවැරදි ව කට පාඩම් කර ගැනීමට
- නිවැරදි ඉරියව් සමගින් උච්චාරණය කිරීමට
- කටපාඩමෙන් පමණක් නොව වචනවල අර්ථය පිළිබඳ මනා සිහියෙන් යුතු ව උච්චාරණය කරන්නට
- හඬ නගා හදවතින් ම උච්චාරණය කරන්නට
- දිනපතා අපගේ යාච්ඤාවේ දී උච්චාරණය කරන්නට

කිතුනු අප නිරන්තරයෙන් ම යොමුවීම වැදගත් ය.

**ක්‍රියාකාරකම**

(1). ස්වාමිවාක් ආරාධනාව ඉගැන්වූයේ,
i. කවු ද?
ii. කාහට ද?

(2). පහත දැක්වෙන වගුව ස්වාමිවාක් ආරාධනාව ඇසුරෙන් සම්පූර්ණ කරන්න.

| යාච්ඤාවේ ප්‍රධාන කොටස් | ස්වාමිවාක් ආරාධනාව |
|---|---|
| 1 ප්‍රශංසාව | 1 ....................................... |
| 2 වන්දනාව | 2 ....................................... |
| 3 ඉල්ලීම | 3 ....................................... |
| 4 කමාව අයැදීම | 4 ....................................... |
| 5 දේව ආරක්ෂාව ට නතුවීම | 5 ....................................... |

(3). ස්වාමිවාක් ආරාධනාවෙහි දක්නට ලැබෙන ප්‍රශංසාත්මක පැතුම් **තුන** හා ශාරීරික හා ආධ්‍යාත්මික ඉල්ලීම් **හතර** වෙන වෙන ම දක්වන්න.



**ජීවිතයට බිඳක්**

*ජේසුස් වහන්සේ ම අපට ඉගැන් වූ 'ස්වාමිවාක් ආරාධනාව' කටපාඩම් කර නිවැරදි ඉරියව් සමගින් අර්ථවත් ව උච්චාරණය කරමින් දෙවි පියාණන් වහන්සේ අමතමු.*